**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**

**පළමු වාර පරීක්ෂණය - 2024**

**ව්‍යවසායකත්වය අධ්‍යනය**

**පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 4 | (21) | 2 | (31) | 4 |
| (2) | 4 | (12) | 4 | (22) | 1 | (32) | 3 |
| (3) | 1 | (13) | 2 | (23) | 1 | (33) | 2 |
| (4) | 4 | (14) | 1 | (24) | 4 | (34) | 1 |
| (5) | 3 | (15) | 1 | (25) | 1 | (35) | 1 |
| (6) | 2 | (16) | 2 | (26) | 3 | (36) | 2 |
| (7) | 1 | (17) | 3 | (27) | 1 | (37) | 1 |
| (8) | 2 | (18) | 2 | (28) | 4 | (38) | 4 |
| (9) | 1 | (19) | 2 | (29) | 1 | (39) | 1 |
| (10) | 4 | (20) | 3 | (30) | 1 | (40) | 1 |

## II පත්‍රය

(1)

(i)
* පරිසර කළමනාකරණය පිළිබඳ උපාධිය
* තමා සතු මුදල්
* 15% ස්ථාවර තැන්පතුව

(ii)
* ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට
* ආයතනයේ අනාගත දිශාව හඳුනා ගැනීමට
* අරමුදල් සම්පාදනය කරගැනීමට
* ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට
* ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනාගැනීමට
* ව්‍යාපාරයේ සාර්ථකත්වය දැනගැනීමට

(iii)
* අයිතිකරු - පියුමාල්
* සේවකයෝ
* මූල්‍ය ආයතන - බැංකුව

(iv)
* විධායක සාරාංශය
* අලෙවි සැලැස්ම
* නිෂ්පාදන සැලැස්ම
* පරිපාලන සැලැස්ම
* මූල්‍ය සැලැස්ම

(v)

| ආර්ථිකයට | පියුමාල්ට |
|---|---|
| * රැකියා උත්පාදනය | * කාර්යන්හි විවධත්වයක් ඇතිවීම |
| * අප ද්‍රව්‍ය කළමනාකරණය | * ආකර්ෂණීය ලාභයක් ඉපයිය හැකිවීම |
| * නවෝත්පාදනය | * ස්වයංපෝෂිත බව |
| * ආර්ථික වර්ධනයට දායක වීම | * නිදහස හා ඉහළ තෘප්තිය |

(vi) මුළු ද්‍රව්‍ය පිරිවැය රු: 1 800 000 කි

(vii) මුළු ශ්‍රම පිරිවැය රු: 240 000 කි

(viii) මුළු නිෂ්පාදන පිරිවැය

| | |
|---|---|
| * අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | - රු: 1 800 000 |
| * කෑම පෙට්ටි නිෂ්පාදකයාගේ වැටුප | - රු: 240 000 |
| * විදුලි බිල | - රු: 48 000 |
| * කෑම පෙට්ටි අච්චු ක්ෂය | - රු: 1 000 |
| | - රු: 2 089 000 |

(ix) කෑම පෙට්ටියක පිරිවැය
ඒකක පිරිවැය = මුළු නිෂ්පාදන පිරිවැය / නිෂ්පාදිත ඒකක ගණන = 2 089 000 / 8 480

= රු: 246.34

(x) කෑම පෙට්ටි අච්චු , මෝටර් බයිසිකලය

(2)

(i) * විවිධත්ව ග්‍රහනය කරගැනීම
* අසාර්ථකත්ව ඉවසීම
* ගැටලු අභියෝග ලෙස දැකීම
* නිර්මාශීලි පුහුණු අවස්ථා
* කුතුහලය දිරිමත් කිරීම
* නිර්මාණශීලිත්වය අගය කිරීම තුළින්

(ii) * අනපේක්ෂිත සිදුවීම්
* වෙළෙඳ පොළේ වෙනස් වීම
* ක්‍රියාවලි අවශ්‍යතා
* ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වන වෙනස්කම්
* දැනුම පදනම් කරගත් සංකල්ප
* සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස් වීම

(iii) * නිර්මාණශීලිත්වය
* නවෝත්පාදනය
* අවදානම් භාරගැනීම
* අනාගත දැක්ම

(iv)

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| * මූලිකව පැන නගී | * දෙවනුව පැන නගියි |
| * සීමිතයි | * අසීමිතයි |
| * පොදුයි | * විවිධයි |
| * උත්පත්තියක් සමග ඇති වේ | * පුද්ගලයන්ට අවශ්‍ය පරිදි ව්‍යවසායකයන් හෝ ව්‍යාපාරියින් නිර්මාණය කරයි |

(v) * ගනුදෙනු අඛණ්ඩව සිදුවීම
* අරමුණක් පැවතීම
* අවදානමක් තිබීම
* ආර්ථික කටයුත්තක් සිදුවීම
* ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදවීම
* මූල්‍යමය ගනුදෙනු සැළකිල්ලට ගැනීම

(3)

(i)

| භාණ්ඩ | සේවා |
|---|---|
| * ස්පෘශ්‍ය වේ.(භෞතික පැවැත්මක් ඇත) | * අස්පෘශ්‍ය වේ (භෞතික පැවැත්මක් නැත) |
| * ගබඩා කළ හැකිය | * ගබඩා කළ නොහැකිය |
| * සපයන්නාගෙන් වෙන් කළ හැකිය | * සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය |
| * පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය නොවේ | * පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි |
| * සමජාතීය බව ආරක්ෂා කළ හැකිය | * සමජාතීය බව ආරක්ෂා කළ නොහැකිය |

(ii) * සේවා නියුක්තිය වැඩි කිරීම
* ජාතික නිෂ්පාදනය වැඩි කිරීම
* ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම
* මහා පරිමාණ ව්‍යාපාරවලින් නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම
* දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම

(iii) * තරගකාරීත්වයට මුහුණදීමට අපහසුවීම
* ව්‍යාපාරික කටයුතු සැලසුම්වලින් තොරව සිදු කිරීම
* ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වල වීම
* ව්‍යාපාරයේ පවතින සම්පත් නිවැරදිව පාලනය නොකිරීම
* දුර්වල මානව සම්බන්ධතා
* ව්‍යාපාරික කටයුතු පිළිබඳ පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම

(iv) ව්‍යාපාර පරිසරය

**අභ්‍යන්තර**
* අයිතිකරු
* කළමනාකරු
* සේවකයින්
* සම්පත්

**බාහිර**
* ආසන්න පරිසරය
* ප්‍රජා පරිසරය
* ආර්ථික පරිසරය
* තාක්ෂණික පරිසරය
* දේශපාලන හා නෛතික පරිසරය
* ස්වභාවික පරිසරය
* ගෝලීය පරිසරය
* සමාජ හා සංස්කෘතික පරිසරය

(v) **මානව නොවන සම්පත් -**
* ස්වාභාවික සම්පත් - උදා : දියඇලි , සාරවත් පස , කොරල්පර , තෙත් වනාන්තර
* ඛණිජ සම්පත් - උදා: මැණික් , මිණිරන් , මැටි , හුණුගල්
* සංස්කෘතික සම්පත් - උදා: අනුරාධපුර , පොළොන්නරුව , ලී කැටයම් , චිත්‍ර , පුරාවස්තු
* ස්වාභාවික වනාන්තර - උදා: යාල , කුමන , සිංහරාජ
* සත්ත්ව සම්පත - උදා: දුර්ලභ ගණයේ , සිවුපාවුන් , කුරුල්ලන් , උරගයින්

(4)

(i)
* පාරිසරික ගැටලු අවම කර ගැනීමට හැකි වීම
* සාර්ථක ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කරගැනීමට හැකිවීම
* වෙළෙඳ පොළ තුළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදිය හැකිවීම
* නව ආදායම් මාර්ග ෂකස් කර ගැනීමේ හැකියාව
* භාවිතයට නොගත් සම්පත් භාවිතයට ගත හැකිවීම
* ආවේණික සම්පත් සුරැකීම හා අනාගතය සඳහා ඉතිරි කිරීම

(ii)
* ගනුදෙනුකරුවන් ප්‍රමාණය හා ඔවුන්ගේ විසිරීම
* අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව
* ශ්‍රමය ලබාගැනීමේ පහසුව
* යටිතල පහසුකම් ලබාගැනීමේ පහසුව
* භූමියේ පිරිවැය

(iii) පරිසරයේ ඇති ගැටලුවකට විසඳුමක් වන පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතුවිල්ලකි.

(iv)

| **ව්‍යාපාර අදහස** | **ව්‍යාපාර අවස්ථා** |
|---|---|
| * ව්‍යාපාර අදහස් සුලභය | * ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ |
| * ව්‍යාපාර අදහස් විවෘතය | * ව්‍යාපාර අදහස් අතුරින් ව්‍යාපාර අවස්ථා අනාවරණය කරගැනීම සියල්ලන්ටම කළ නොහැකිය |
| * බොහෝ අය ඒවා දනිති | |
| * සෑම ව්‍යාපාර අදහසක්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකිය | * ව්‍යාපාර අවස්ථා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය |

(v) සිසුවාගේ පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

(5)

(i) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී එම ව්‍යාපාරය මගින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඒ සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විවිධ කාර්යයන් සංවිධානය කර විධිමත් ආකාරයකට පිළියෙල කරනු ලබන ලේඛනය ව්‍යාපාර සැලැස්මයි

(ii)
* ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමක් කළ නොහැකි වීම
* ව්‍යාපාර අදහස පැහැදිලිව ප්‍රකාශ කළ නොහැකිවීම
* අරමුදල් සම්පාදනය කර ගැනීමේදී ගැටලු ඇති වීම
* ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනාගැනීමට නොහැකිවීම
* ව්‍යාපාරය පිළිබඳ සමස්ථ අවබෝධයක් ලබාගැනීම අපහසුවීම

(iii)
* වෙළෙඳ පොළ විශ්ලේෂණය
* යෝජිත ව්‍යාපාරයේ අලෙවිකරණ උපාය මාර්ගය
* විකුණුම් පුරෝකථනය
* විකුණුම් ආදායම හා අලෙවි වියදම්
* අලෙවි ස්ථාවර වත්කම්

(iv) * ස්වකීය භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම
* ඉලක්කගත පාරිබෝගිකයා
* තරගකරුවන්

(v) * පාරිභෝගිකයින්ට ප්‍රශ්නාවලි ලබාදී පිළිතුරු ලබාගැනීම
* පාරිභෝගිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම
* වෙළෙඳ පොළ තුළ පාරිභෝගිකයන් ගනුදෙනු කරන ආකාරය නිරීක්ෂණය කිරීම
* පුවත්පත් , සඟරා , වාර්තා , අන්තර්ජාල වැනි මූලාශ්‍ර අධ්‍යයනය කිරීම

(6)

(i) **හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ -**
* අවශ්‍ය සම්පත් සපයා ගත හැකිවීම
* ඉල්ලුමක් පැවතීම
* ආකර්ෂණීය ඉපැයුමක් තිබීම
* තරගකාරීත්වයට මුහුණ දිය හැකි වීම
* නීතිරීතිවලට අනුකූල විම

(ii) * සාර්ව විශ්ලේෂණය
* සූක්ෂම විශ්ලේෂණය
* ශදුඅත විශ්ලේෂණය

(iii) * නව නිමැවුමක්
* නව යන්ත්‍රයක්
* සංකලනයක්
* නව ක්‍රියාවලියක්
* පවත්වා සොයාගැනීමක වැඩි දියුණු කිරීමක්

(iv) අලෙවි හා බෙදාහැරීමේ භාවිතා කරන -
* ඉඩම් හා ගොඩනැගිලි
* යන්ත්‍ර උපකරණ
* රථ වාහන
* කාර්යාල උපකරණ
*ලීබඩු

(v) විකුණුම් පුරෝකථනය යනු ඉදිරි නිශ්චිත කාලයකදී ව්‍යවසායකයා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා ප්‍රමාණය තීරණය කිරීමයි

(7)

(i)

| අයිතමය | දෛනික අවශ්‍යතාව | ඒකකයක වියදම රුː | මුළු වියදම රුː |
|---|---|---|---|
| සීනි | 02 Kg | 250.00 | 500.00 |
| හාල්පිටි | 02 Kg | 250.00 | 500.00 |
| පොල්තෙල් | 02 L | 450.00 | 900.00 |
| දරමිටි | 05 | 60.00 | 300.00 |
| ශ්‍රමික වැටුප් | 01 | 2 000.00 | 2 000.00 |
| | | **3 010.00** | **4 200.00** |

(ii) රන්රස ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය රුː 4 200 කි

(iii) කැවුම් ගෙඩියක පිරිවැය $= \frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදිත ඒකක ගණන}}$

$= \frac{4\ 200}{100}$

= **රුː 42 . 00**

කැවුම් ගෙඩියක පිරිවැය රුː 42 කි